**සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම - 2025**
**----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගම මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සමාගමේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගම සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන ශ්‍රී ලංකා සමාගම් පනත | | | |
| | (i) 131 (1) වගන්තිය | සෑම සමාගමක්ම අවම වශයෙන් වසරකට වරක්වත් වාර්ෂික වාර්තාව (Annual Return) සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ලබාදිය යුතු වුවද, 2020 වර්ෂයෙන් පසුව වාර්ෂික වාර්තා (Annual Return) සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත්කර නොතිබුණි. | 2021 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ බවත් 2025 දෙසැම්බර් 31 දින දක්වා ඉතිරි වාර්ෂික වාර්තා මෙම වසර අවසන් වීමට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | 2007 අංක 07 දරන ශ්‍රී ලංකා සමාගම් පනතේ 131(1) වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තා සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය. |
| | (ii) 223 (2) (අ) සහ (ආ) වගන්ති | සමාගමේ ලේකම් හෝ අධ්‍යක්ෂවරුන් පිළිබඳව වෙනසක් සිදු වූ විට ඒ වෙනස සහ සමාගමේ ලේකම්වරුන් හා අධ්‍යක්ෂවරුන්ගේ ලේඛනයෙහි ඇතුළත් විස්තරවල යම් වෙනසක් සිදු වූ විට ඒ වෙනස, නියමිත ආකෘතිය අනුව ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් වෙත යැවීමට වග බලා ගත යුතු වුවද 2019 වර්ෂයෙන් පසුව සිදුවූ වෙනස්කම් සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | සමාගම් පනතේ 223 (2) (අ) සහ (ආ) වගන්ති යටතේ අධ්‍යක්ෂකවරුන්ගේ වෙනස් වීම් නියමිත ආකෘති ප්‍රකාරව ඉදිරිපත් කර යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | 2007 අංක 07 දරන ශ්‍රී ලංකා සමාගම් පනතේ 223(2)(අ) හා (ආ) වගන්ති අනුව සමාගමේ ලේකම් හා අධ්‍යක්ෂවරුන් සම්බන්ධ වෙනස්කම් සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 38 | පනතේ 38 (I) වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව මූල්‍ය පාලනය සඳහා සකස්කල | අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීතාවය | ජාතික විගණන පනතේ 38(2) උප වගන්තිය අනුව |

| | | | | |
|---|---|---|---|---|
| | (2) උප වගන්තිය | අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සමාලෝචනය සඳහා අවශ්‍ය අවදානම් තක්සේරු නිර්ණායක ඉදිරි විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඒ අනුව කටයුතු කරන බව. | අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳ ලිඛිත සමාලෝචනයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ 10.1 වගන්තිය, 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 හි 02 (iv) වගන්තිය හා 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ. | ඇඟිලි සළකුණු මුද්‍රිත පිටපත් පරීක්ෂා කිරීමේදී චක්‍රලේඛ අවශ්‍යතාවය වන පැය 08 කාලයක් සේවය ඉටු නොකරන ලද නිලධාරීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,311,713 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. තවද එක් කාර්යයක් වෙනුවෙන් අදාළ කරගත යුත්තේ එක් දීමනාවක්/ වරප්‍රසාදයක් පමණක් වුවද මෙම දීමනාවට අමතරව ඉරිදා දිනයක වැඩ කරන නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.358,872ක නිවාඩු දින දීමනාවක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. එසේම ලිත් මාසයකට දින 02 වැඩි දින ගණනක් සේවයේ යෙදවීම අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය පෞද්ගලිකව ලබාගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සමාගම රාජ්‍ය ව්‍යාපාරයක් බැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා ආයතන සංග්‍රහය අදාළ නොවන බවත්, සමාගම විසින් සකස් කළ පරිපාලන රීති සංග්‍රහය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත්, සේවා නියුක්ත පැය මත ගෙවීම් සිදු කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛයක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශ මත රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කිරීමට නියමිත බවත්, හිලව් නිවාඩු දීමනාව අදාළ සේවා කාණ්ඩවලට එකම ක්‍රමවේදය අනුව ගෙවා ඇති බවත්, පැය 24 පුරා ක්‍රියාත්මක නිෂ්පාදන කටයුතු හේතුවෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සේවය මාසයකට දින 02කට සීමා කිරීම ප්‍රායෝගික නොවන බව සහ ඒ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්ඡා කර රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන බව. | ආයතන සංග්‍රහය හා අදාළ චක්‍රලේඛ විධිවිධාන අනුව සේවා කාලය, දීමනා ගෙවීම් හා අනුමැති ලබා ගැනීම නිසි පරිදි සිදු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල්, බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත්, ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරී කාණ්ඩයන් සම්බන්ධ විස්තර විගණන හා කළමණාකරණ කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 880 සහ රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 79,375,055 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 537,065,431 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 457,690,376 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහමට නිශ්පාදනය පහළයාම මත අලෙවි ආදායම අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිෂ්පාදන කාර්යක්ෂමතාවය නිසි ලෙස ඇගයීම, අපතය පාලනය කිරීම සහ නිෂ්පාදන පිරිවැය නිවැරදිව ගණනය කිරීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලියේ සාමාන්‍ය අපතය හා නිමැවුම් අනුපාතය සඳහා සම්මතයන් (Norms) ස්ථාපිත කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදන ක්‍රියාවලියේ පැවති අපතය සාමාන්‍ය හෝ අසාමාන්‍ය අපතයක් ද යන්න තහවුරු කිරීමට විගණනයේදී නොහැකි විය. | මේ සඳහා එක් අයෙකු ITI ආයතනයෙන්ද , තවත් අයෙකු NERD ආයතනයෙන් ද, අනෙකුත් තිදෙනා ත්‍රිපෝෂ ආයතනයෙන් ද අන්තර්ගතව පස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | නිෂ්පාදන ක්‍රියාවලි තුළ අපතය සඳහා අදාළ සම්මතයන් (Norms) ස්ථාපිත කර ඒ අනුව පාලනය හා ඇගයීම් සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | | සමාගමේ ත්‍රිපෝෂ බෙදාහැරීමේ ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | (i) | ශ්‍රී ලංකාවේ පෝෂණය අවශ්‍ය සියලු ගැබිණි සහ කිරිදෙන මව්වරුන් සඳහා ත්‍රිපෝෂ නිෂ්පාදනය කර නොමිලේ බෙදාහැරීම ත්‍රිපෝෂ සමාගමේ ප්‍රධාන කාර්යභාරය වන බැවින් ඉලක්කගත ප්‍රතිලාභීන්ට ත්‍රිපෝෂ බෙදාහැරීම පිළිබඳ පරීක්ෂාවේදී ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල (RDHS) ඇතුළු රෝහල් හා ආයතන 39 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ත්‍රිපෝෂ මාස්ටර් බෑග් අවශ්‍යතාවය 699,313 ක් වූ අතර සත්‍ය වශයෙන් බෙදාහරින ලද මාස්ටර් බෑග් ප්‍රමාණය 180,938 ක් වූ බැවින් එය අවශ්‍යතාවයෙන් සියයට 25.87 ක් පමණක් විය. එසේ වුවද සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ ත්‍රිපෝෂ අවශ්‍යතාවයට සාපේක්ෂව බෙදාහැරීමේ ප්‍රගතිය සියයට 34.29 ක් ලෙස දක්වා තිබුණි. | ත්‍රිපෝෂ මාස්ටර් බෑග් අවශ්‍යතාවය බෑග් 699,313ක් නොව, 527,690ක් බවත් මාස 06ත් අවුරුදු 03ත් අතර ළමුන් සඳහා “C” ඇසුරුම වෙනුවට නව සහල් මිශ්‍ර ත්‍රිපෝෂ නිෂ්පාදනය හඳුන්වා දී ඇති බවත් , එහි නිෂ්පාදන ධාරිතාව සීමිත වීම හේතුවෙන් ප්‍රමුඛතා අනුපිළිවෙල මත දිස්ත්‍රික්ක කිහිපයකට පමණක් බෙදාහැරීම් සිදු කළ බවත් ඒ අනුව 2025 වර්ෂයේදී ත්‍රිපෝෂ මාස්ටර් බෑග් 180,938 ක් බෙදාහැර ඇති බව සහ එය සම්පූර්ණ අවශ්‍යතාවයෙන් සියයට 34.29 ක් බව. | ත්‍රිපෝෂ අවශ්‍යතා නිසි පරිදි තක්සේරු කර ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත ප්‍රමාණවත් තොග නියමිත පරිදි බෙදාහැරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) | සමාගම වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය තක්සේරු කර මාසිකව ඒවා සැපයීමට අවශ්‍ය කටයුතු කිරීම සිදුකළ යුතු වුව ද මාසික ත්‍රිපෝෂ බෙදාහරින ලද ප්‍රමාණය අවශ්‍යතාවයෙන් සියයට 0 සිට සියයට 58 පරාසයකින් යුක්ත වූ අතර ත්‍රිපෝෂ නිෂ්පාදනය කර බෙදාහැරීම නිසි සැලැස්මකින් සිදු නොකිරීම මීට හේතු වී තිබුණි. | වසර පුරා ආනයනික අමුද්‍රව්‍ය (බඩඉරිඟු හා සෝයා) සීමාකාරී සාධකයක් වූ බවත් දේශීය අමුද්‍රව්‍ය ගුණාත්මක තත්වයෙන් නොමැති වූ බවත් යන සමාගමට පාලනය කල නොහැකි හේතුන් මත ප්‍රසම්පාදන ගැටලු පැනගැනීම හේතුවෙන් නිෂ්පාදන කටයුතු ක්‍රමවත්ව සිදු නොවූ බව සහ බෙදාහැරීම් කටයුතුද ක්‍රමවත්ව සිදු කිරීමට නොහැකි වූ බව. | වාර්ෂික අවශ්‍යතාවය නිසි පරිදි තක්සේරු කර සැලසුම්ගතව ත්‍රිපෝෂ නිෂ්පාදනය හා බෙදාහැරීම සිදු කළ යුතුය. |
| (ඇ) | | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය 07 දෙනෙකුගෙන් සමන්විත වන අතර එය අදාළ අංශ නියෝජනය වන පරිදි පත්කර ඇති බව නිරීක්ෂණය විය. එසේ වුවද සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් නියෝජිතයා ලෙස | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම ආරාධනා කරන බව. | සමාගමේ කටයුතු ඵලදායී අධීක්ෂණය සඳහා පත්කර ඇති අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සක්‍රීයව සහභාගී විය යුතුය. |

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කර තිබුණද සමාලෝචිත වර්ෂයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 13 න් එක් රැස්වීමක් සඳහා පමණක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා මාර්ගගත ක්‍රමය ඔස්සේ සහභාගී වී තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව කරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | සමාලෝචිත වර්ෂයේදී සැලසුම්ගත ත්‍රිපෝෂ සහ සුපෝෂ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 21,872.7 (Blend 24,375) ක්වූ අතර තත්‍ය ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5,233.095 (Blend 5814.5) ක් වූයෙන් තත්‍ය නිෂ්පාදනය, සැලසුම්ගත නිෂ්පාදනයෙන් සියයට 23.9 ක් වූ ඉතා පහළ අගයක් විය. මුළු නිෂ්පාදනයෙන් ත්‍රිපෝෂ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3,957.7(75.6%) ක් හා සුපෝෂ මෙට්‍රික් ටොන් 1,275.3 (24.4%) ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ත ත්‍රිපෝෂ අවශ්‍යතාවයෙන් බෙදාහැරීම සියයට 25.87 ක පමණක් විය. එබැවින් සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලියට අනුව ශ්‍රී ලංකාවේ මාතෘ හා ළදරු මන්දපෝෂණය අවම කරනු පිණිස ශ්‍රී ලංකාව විසින් බලගන්වනු ලබන අතිරේක ආහාර නිෂ්පාදනයන් සඳහා පහසුකම් සැලසීම හා වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සපුරාලීමට සමාගම අපොහොසත් වි තිබුණි. | ආනයනික අමුද්‍රව්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලීන්හි පැවති දුෂ්කරතා සහ දේශීය අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවයේ අඩුපාඩු හේතුවෙන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය බඩ ඉරිඟු සහ සෝයා නිසි ප්‍රමිතියෙන් හා ප්‍රමාණයෙන් සපයා ගැනීමට නොහැකි වූ බවත් එම හේතුවෙන් නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බවත් සහ ත්‍රිපෝෂ නිෂ්පාදනය වැඩි ප්‍රමාණයක් සහ අතිරේකව සුපෝෂ නිෂ්පාදනය සිදු කිරීමට සැලසුම් කර ඇති බව සහ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් බිල්පත් පියවීමේ ප්‍රමාදය, කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හේතුවෙන් මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා සුපෝෂ නිෂ්පාදනය හා අලෙවියද සිදුකල යුතු බව. | ජාතික පෝෂණ අවශ්‍යතාවයට සරිලන පරිදි සැලසුම්ගත නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් ත්‍රිපෝෂ නිෂ්පාදනය කාර්යක්ෂමව බෙදාහැරීමටත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මාසික තත්‍ය ත්‍රිපෝෂ නිෂ්පාදනය සියයට 1.1 සිට සියයට 58 දක්වා වූ ප්‍රතිශතයන්ගෙන් නිෂ්පාදනය කිරීමට සමාගම කටයුතු කර තිබුණද, තත්‍ය සුපෝෂ නිෂ්පාදනය සියයට 25.3 සිට සියයට 155.7 දක්වා වූ ප්‍රතිශතයකින් නිෂ්පාදනය කිරීමට සමාගම | 2025 පෙබරවාරි සහ මාර්තු මාසවල සුපෝෂ නිෂ්පාදනය වැඩි වූයේ රජයේ විශේෂ සහන පැකේජයක් සඳහා සී/ස ලංකා සතොස සමාගම හරහා ලැබුණු ඇණවුම් | නිෂ්පාදන අවශ්‍යතා හා ජාතික පෝෂණ වැඩසටහන්වල ප්‍රමුඛතා අනුව නිෂ්පාදන කළමනාකරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය. ත්‍රිපෝෂ නිෂ්පාදනයේ මාසික ඉලක්ක සපුරා ගැනීමකින් තොරව සුපෝෂ නිෂ්පාදන මාසික ඉලක්ක ඉක්මවා නිෂ්පාදනය කිරීම තුළින් සමාගමෙහි අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. | හේතුවෙන් බව සහ අමුද්‍රව්‍ය සීමාකාරී වුවද, වර්ෂයේ සමස්ත නිෂ්පාදනයෙන් ත්‍රිපෝෂ සියයට 76ක් සහ සුපෝෂ සියයට 24ක් නිෂ්පාදනය කර ඇති බව. | |
| (iii) | සමාලෝචිත වර්ෂයේ සමාගම විසින් ඉදිරිපත් කරන ලද නිෂ්පාදන කාර්යසාධනය අනුව, නිෂ්පාදනය සිදුකරන ලද දින ගණන 118 ක් වූ අතර නිෂ්පාදනය සිදුනොකළ දින ගණන 164 ක් විය. ඒ සඳහා නිෂ්පාදනයෙහි ප්‍රධානතම අමුද්‍රව්‍යයන් වන සෝයා හා බඩඉරිඟු අවශ්‍යතාවය සපුරාගැනීමට නොහැකි වීම හේතු වී තිබුණි. ඒ අනුව වර්ෂයෙන් අඩකටත් වඩා වැඩි කාලයක් නිෂ්පාදනයේ නිරත වී නොතිබුණි. | සමාගමට පාලනය කළ නොහැකි හේතූන් මත ආනයනික අමුද්‍රව්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලීන්හි පැවති දුෂ්කරතා සහ දේශීය අමුද්‍රව්‍ය නිසි ගුණාත්මකතාවයකින් යුක්ත නොවීම හේතුවෙන් අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක ලඟා කර ගැනීමට නොහැකි වූ බව. | නිෂ්පාදනය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා අමුද්‍රව්‍ය කඩිනමින් හා ප්‍රමාණවත් ලෙස සපයා ගැනීමට විධිමත් සැලසුම් ක්‍රියාත්මක කළ යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන අංශය විසින් Blend වශයෙන් නිෂ්පාදනය කළ ත්‍රිපෝෂ සහ සුපෝෂ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5,233 ක් වූ අතර ගිණුම් අංශය ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5,009.6 ක් විය. ඒ අනුව ත්‍රිපෝෂ සහ සුපෝෂ නිෂ්පාදනයෙහි මෙට්‍රික් ටොන් 223.4 ක වෙනසක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේ කෙටුම්පත් විගණකාධිපති වාර්තාවට සමාගමේ සභාපති විසින් ඉදිරිපත් කරන ලද පිළිතුර අනුව Blend වශයෙන් නිෂ්පාදිත ප්‍රමාණය හා අවසන් නිෂ්පාදිතය තුළ පැවතිය හැකි ත්‍රිපෝෂ සහ සුපෝෂ ප්‍රමාණය අතර වෙනසට හේතූන් ලෙස සෑම පැකට් 1ක් තුළ වැඩිපුර ග්‍රෑම්10 ත් 15 ත් අතර ප්‍රමාණයක් අන්තර්ගත කර තිබීම, පවුඩර් ලෙස ඉවත්වන අපතය හා Dry CSB (වියලි බඩ ඉරිඟු සහ සෝයා මිශ්‍රණ) අපතයෙන් ¼ ක් ද අපතයන් ලෙස දක්වා තිබුණි. ඉහත කරුණු සැළකිල්ලට ගෙන කරන ලද ගණනය කිරීම් වලට අදාළව සමාලෝචිත වර්ෂයේදී සමස්ථ නිෂ්පාදනයෙන් අපතය මෙට්‍රික් ටොන් 101 ක් වියයුතු වුවද, තවදුරටත් මෙට්‍රික් ටොන් 122 ක නිෂ්පාදන වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය. | ISO 22000 තත්ත්ව සහතිකය සඳහා සිදු කළ ක්‍රමාංකනයේදී මිශ්‍රණ යන්ත්‍රයේ බර කිරීමේ පද්ධතිය 900 kg ලෙස දර්ශනය වුවද සත්‍ය බර 870 kg ක් බව අනාවරණය වී ඇති බවත් එලෙස එක් මිශ්‍රණයකින් 20–30 kg පමණ අඩුවී පැවතීම විගණනයෙන් පෙන්වා දුන් මෙ.ටො. 225ක නිෂ්පාදන වෙනසට ද හේතු වූ බව සහ යන්ත්‍රයේ බර කිරීමේ නව පාලන පද්ධතියක් සවිකර වාර්ෂිකව දෙවරක් ක්‍රමාංකනය කිරීමට තීරණය කර ඇති බව. | නිෂ්පාදන දත්තවල නිරවද්‍යතාව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතුය. |
| (v) | ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදන ක්‍රියාවලියේ අවසන් අදියරේදී මිශ්‍ර කරනු ලබන සම්මත ඛනිජ ලවණ හා කිරිපිටි ප්‍රමාණය පිළිවෙලින් සියයට 0.9 හා සියයට 3 ක් වේ. නිෂ්පාදන අංශය විසින් ලබා දෙන ලද තොරතුරු අනුව මුළු නිෂ්පාදනය | මිශ්‍රණ ක්‍රියාවලියේදී කිරි පිටි, විටමින් හා ඛනිජ ද්‍රව්‍ය අතින් මිනුම් කර එකතු කිරීම නිසා අතපසු වීම් ඇතිවිය හැකි බව සහ එම දෝෂය අවම කිරීම | නිෂ්පාදන සඳහා අමු ද්‍රව්‍ය යෙදීමේ සංයුතියට අනුකූලව අමුද්‍රව්‍ය භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වූ කිලෝග්‍රෑම් 5,233,095 සඳහා වැය විය යුතු කිරිපිටි හා ඛනිජ ලවණ ප්‍රමාණය පිළිවෙලින් කිලෝග්‍රෑම් 156,992.85 ක් හා කිලෝග්‍රෑම් 47,097.85 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ භාවිතා කරන ලද කිරිපිටි හා ඛනිජ ලවණ ප්‍රමාණය පිළිවෙලින් කිලෝග්‍රෑම් 157,075 හා කිලෝග්‍රෑම් 46,293.25 විය. ඒ අනුව, සමස්ත නිෂ්පාදනය සැලකීමේදී කිරිපිටි කිලෝග්‍රෑම් 82 ක් වැඩියෙන් හා ඛණිජ ලවණ කිලෝග්‍රෑම් 804.6 ක් අඩුවෙන් භාවිතා කර තිබුණි. එම නිසා නියමිත ප්‍රමිතියකින් ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදනය නොවන බැවින් ශ්‍රී ලංකාවේ මන්දපෝෂණය තුරන් කර නිරෝගී ජාතියක් ගොඩනැගීමේ අරමුණින් ත්‍රිපෝෂ නිෂ්පාදනය කර නොමිලේ බෙදාහැරීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටු නොවන බව නිරීක්ෂණය විය. | සඳහා Dosing Unit එකක් සවි කර යන්ත්‍රානුසාරයෙන් නිවැරදිව මිශ්‍ර කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීමට යෝජනා කර ඇති බව. | |
| (vi) | සමාගමේ නිෂ්පාදන කටයුතු සඳහා පවතින Anderson I හා Anderson II යන්ත්‍ර 02 හි නිෂ්පාදන ධාරිතාවය පිළිවෙලින් 1,800 Kg/hr (Blends 2) හා 3,600 Kg/hr (Blends 4) ක් ලෙස මුළු යන්ත්‍ර ධාරිතාවය පැයකට කිලෝ ග්‍රෑම් 5,400 ක් විය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී Anderson I යන්ත්‍රය දින 89 ක් හා Anderson II යන්ත්‍රයෙන් දින 298 ක් භාවිතා කර Blend 24,375ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද Anderson I යන්ත්‍රය වර්ෂය පුරාම නිෂ්කාර්යව පැවති බවත් Anderson II යන්ත්‍රය 2,025 Kg/hr (Blends 2.25) ක අඩු සාමාන්‍ය අගයකින් දින 119 ක් පමණක් භාවිතා කර තිබූ බවත් නිරීක්ෂණය විය. | ප්‍රමාණවත් අමුද්‍රව්‍ය හා සේවකයින් නොමැති වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ බවත් මෙම වර්ෂයේ Anderson 1 යන්ත්‍රය යොදා ගනිමින් සහල් ත්‍රිපෝෂ නිෂ්පාදනය කිරීමට සැලසුම් කල බව සහ ඒ සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ඇනවුම් කර ඇති බව. | නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම සඳහා පවතින යන්ත්‍ර ධාරිතාව ප්‍රශස්ත ලෙස භාවිතා කළ යුතුය. |
| (vii) | සමාගමේ නිෂ්පාදන ක්‍රියාවලියේදී අඛණ්ඩව දින කිහිපයක නිෂ්පාදනයකින් අනතුරුව යන්ත්‍ර නඩත්තුව හා පිරිසිදු කිරීම් කර ඉන් එකතු වන ද්‍රව්‍ය අපතය ලෙස ඉවත් කිරීමෙන් පසු නැවත නිෂ්පාදනය ආරම්භ කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන සැලැස්ම අනුව දින 5 සිට 24 දක්වා නිෂ්පාදන වාර 26ක් සැලසුම්කර තිබුණ ද තත්‍ය නිෂ්පාදන ක්‍රියාවලියේදී නිෂ්පාදන වාර 23 ක් දින 02 සිට දින 13 දක්වා වූ අඩු කාල පරාසයන් තුළ සිදුකර තිබුණි. මේ හේතුවෙන් ඉකුත් වර්ෂයේ Dry CSB හා පවුඩර් අපතයට සාපේක්ෂව මෙම වර්ෂයේදී Dry CSB හා පවුඩර් අපතය සියයට 10.8 කින් ඉහළ ගොස් තිබුණි. | අමුද්‍රව්‍ය අඛණ්ඩව නොලැබීමත්, අමු ද්‍රව්‍ය ලැබෙන පරිදි නිෂ්පාදනය සිදු කිරීමත් හේතුවෙන් නිෂ්පාදන හා පිරිසිදු කිරීමේ වාර ගණන වැඩිවූ බවත් සැලසුම් පරිදි නිෂ්පාදනය සිදු වූයේ නම් අපතය අවම කර ගැනීමට හැකි වන බව සහ තව දුරටත් අපතය අඩු කිරීම සඳහා පත් කළ කමිටුවේ විශේෂ අවධානය යොමු කර ඇති බව. | අපතයන් අවම වන පරිදි නිෂ්පාදන හා නඩත්තු කාලසටහන් විධිමත්ව සැලසුම් කළ යුතුය. |